සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය 2022 (2023)   1350

11 ශ්‍රේණිය | ගණිතය - I | පැය දෙකයි

නම/ විභාග අංකය : ....

A කොටස

★ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.**

01. $m^n = 16$ නම් පහත දී ඇති සම්බන්ධතා වලින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
i) $\log_m n = 16$ ii) $\log_{16} m = n$ iii) $\log_m 16 = n$ iv) $\log_{16} n = m$

02. සුළු කරන්න. $\frac{3}{4x} - \frac{1}{6x}$

03. රූපයේ දී ඇති තොරතුරු අනුව $2x^0$ මගින් දැක්වෙන කෝණයේ අගය සොයන්න.



04. $2x + 1 \le 3$ විසඳා සියලු විසඳුම් දී ඇති සංඛ්‍යා රේඛාව මත දක්වන්න.



05. මිනිසුන් 12 දෙනෙකු දින 3 ක දී වැඩකින් $\frac{3}{4}$ ක් නිම කරයි. මුළු වැඩ ප්‍රමාණය මිනිස් දින කීයද ?

06. අරය 7 cm ක් වන සිලින්ඩරයක වක්‍ර පෘෂ්ඨයේ වර්ගඵලය 56π නම් සිලින්ඩරයේ උස සොයන්න.

07. රූපයේ දැක්වෙන්නේ ABCD සමාන්තරාස්‍රයකි. C සිට දික් කළ AB පාදයට ලම්බකව CE ඇඳ ඇත. $A\hat{D}C = 125^0$ නම් $B\hat{C}E$ විශාලත්වය සොයන්න.



EXAMRESULTS.LK

08. $4xy \div \frac{1}{2x}$ සුළු කරන්න.

09. $B = \{1, 2, 3, 4, 5\}$ නම් දී ඇති වෙන් රූපසටහනෙහිම B කුලකය ඇඳ, අවයව ලියා වෙන් රූපසටහන සම්පූර්ණ කරන්න.



10. බස් රථයකට ගමනෙහි පළමු 75 km යාම සඳහා මිනිත්තු 45 ක් ද, ඉතිරි 105 km යාම සඳහා පැය 1 මිනිත්තු 15 ක් ද ගත විය. බස්රථය ගමන් කළ මධ්‍යක වේගය පැයට කිලෝමීටර් වලින් සොයන්න.

11. දී ඇති රූපයේ AC හා BE, D හි දී ලම්බකව ඡේදනය වෙයි. BD = DE ද, AB = DC ද වෙයි. අංගසම ත්‍රිකෝණ යුගලයක් නම් කර අංගසම අවස්ථාව සඳහන් කරන්න.



12. 4% ක මාසික සුළු පොළියට ණයට ගත් මුදලක් සඳහා මසකට ගෙවිය යුතු පොළිය රු. 1 200 ක් නම් ණය මුදල සොයන්න.

13. $6a^2, 3ab, a^2b^2$ යන පදවල කුඩාම පොදු ගුණාකාරය සොයන්න.

14. ආරෝහණ පිළිවෙලට ලියා ඇති දත්ත 15 ක් ඇති සංඛ්‍යා වැලක මුල් දත්ත 8 පහත දැක්වේ.
15, 17, 18, 18, 20, 20, 21, 24
i) මධ්‍යස්ථය සොයන්න.

ii) පළමු චතුර්ථකය සොයන්න.

15. රූපයේ දී ඇති තොරතුරු අනුව,
i) $\tan\theta$ සොයන්න.

ii) $\sin(90 - \theta)$ සොයන්න.



16. සාධක වලට වෙන් කරන්න. $n^2 - 13n - 30$

17. රූපයේ දැක්වෙන වෘත්තයේ කේන්ද්‍රය O වෙයි. ABCD වෘත්ත චතුරස්‍රයේ CD පාදය E තෙක් දික් කර ඇත. AB හි මධ්‍ය ලක්ෂ්‍යය F වන අතර දී ඇති තොරතුරු ඇසුරෙන් x හි අගය සොයන්න.



18. 8, 16, 32, ... ගුණෝත්තර ශ්‍රේඪියේ 24 වන පදය 2 හි බලයක් ලෙස ලියන්න.

---

19. රූපයේ දී ඇති තොරතුරු ඇසුරින් x හි අගය සොයන්න.



---

20. ABCD යනු වෘත්තය මත පිහිටි ලක්ෂ්‍ය හතරකි. $B\hat{A}D = 85^0, C\hat{D}E = 40^0$ ද $CE = DE$ ද නම් x හි අගය සොයන්න.



---

21. සවිධි නොනැඹුරු ඝනකාකාර දාදු කැටයක මුහුණත් 3 ක රතු වර්ණය ද, මුහුණත් 2 ක නිල් වර්ණය ද ඉතිරි මුහුණතේ කොළ වර්ණය ද ආලේප කර ඇත. දාදු කැටය උඩ දමා වැටෙන පැත්ත නිරීක්ෂණය කිරීමේ දී රතු වර්ණය හෝ කොළ වර්ණය ලැබීමේ සම්භාවිතාව සොයන්න.

---

22. රූපයේ දැක්වෙන AB සරල රේඛාවේ සමීකරණය ලියන්න.



---

23. 6000 l ධාරිතාවකින් යුත් වැංකියක් සම්පූර්ණයෙන් ජලයෙන් පිරී ඇත. මිනිත්තුවට 75 l ක ඒකාකාර ශීඝ්‍රතාවකින් ජලය පිටකරන පොම්ප 4 ක් එකවිට භාවිත කරමින් වැංකිය සම්පූර්ණයෙන් හිස් කිරීමට ගත වන කාලය සොයන්න.

---

24. දී ඇති රූපයේ AB හා DC යනු සමාන්තර ජ්‍යාය දෙකකි. AC හා BD, P හි දී ඡේදනය වෙයි. $B\hat{A}C = 50^0$ නම් $A\hat{P}D$ හි අගය සොයන්න.



---

25. AB ට 5.5 cm ක් දුරින් චලනය වන ලක්ෂ්‍යයක පථයේ එක් කොටසක්QR වන අතර C යනු QR මත පිහිටි ලක්ෂ්‍යයකි. AC ට හා AB ට සමදුරින් චලනය වන QR මත පිහිටි P ලක්ෂ්‍යය සොයාගැනීමට අවශ්‍ය නිර්මාණ රේඛා වල දළ සටහනක් අඳින්න.



B කොටස

01. ඇඟළුම් කර්මාන්තශාලාවක සේවය කරන පිරිසෙන් $\frac{3}{4}$ ක් නිෂ්පාදන අංශයේ ද, $\frac{1}{7}$ ක් ඇසුරුම් අංශයේ ද සේවය කරති.

i) නිෂ්පාදන අංශයේ හා ඇසුරුම් අංශයේ සේවය කරන පිරිස මුළු සේවක සංඛ්‍යාවෙන් කිනම් භාගයක්ද ?

ii) නිෂ්පාදන අංශයේ හා ඇසුරුම් අංශයේ නොවන 120 දෙනෙක් වෙනත් අංශවල සේවය කරති. ඇඟළුම් කර්මාන්තශාලාවේ සේවය කරන මුළු පිරිස කොපමණද ?

iii) නිෂ්පාදන අංශයේ සේවය කරන මුළු පිරිසෙන් 560 ක් මැහුම් අංශයේ ද ඉතිරි අය කැපුම් අංශයේ ද සේවය කරයි නම්, කැපුම් අංශයේ සේවය කරන පිරිස ඇඟළුම් කර්මාන්තශාලාවේ සේවය කරන මුළු පිරිසෙන් කිනම් භාගයක්ද ?

02. ABCD සෘජුකෝණාස්‍රාකාර කොටසකින් හා BE විෂ්කම්භය වන BFE අර්ධ වෘත්ත කොටසකින් ද සමන්විත ප්‍රදර්ශන කුටියක් රූපයේ දැක්වේ. AB = 7 m වෙයි.



i) අර්ධ වෘත්ත කොටසේ වර්ගඵලය සොයන්න.

ii) සෘජුකෝණාස්‍ර කොටසේ වර්ගඵලය, අර්ධ වෘත්ත කොටසේ වර්ගඵලය මෙන් දෙගුණයක් නම් BC දිග සොයන්න.

iii) ප්‍රදර්ශන කුටියේ පරිමිතිය සොයන්න.

iv) ප්‍රදර්ශන කුටියේ CBFE මායිම දිගේ C සිට E තෙක් 2 m පරතරය ඇතිව සිටුවීමට අවශ්‍ය කොඩි කණු සංඛ්‍යාව සොයන්න.

03. (a) මිනිසෙක් කොටසකට ලාභාංශය රු. 6 ක් ගෙවන, වෙළඳපොළ මිල රු. 30 ක් වන කොටස් මිලදී ගැනීමට රු. 75 000 ක් ආයෝජනය කළේය.

i) මිලදී ගත් කොටස් ගණන සොයන්න.

ii) වර්ෂය අවසානයේ ලැබෙන ලාභාංශ ආදායම කොපමණ ද ?

iii) ඔහු මිලට ගත් කොටස් සියල්ලම වර්ෂය අවසානයේ විකුණා ලැබූ ප්‍රාග්ධන ලාභය රු. 32500 ක් නම්, කොටසක විකුණුම් මිල සොයන්න.

(b) වාර්ෂික වටිනාකම රු. 84 000 ක් ලෙස තක්සේරු කර ඇති නිවසකින් කාර්තුවකට අය කරන වරිපනම් බදු මුදල රු. 1 890 කි. පළාත් පාලන ආයතනය අය කරන වාර්ෂික වරිපනම් බදු ප්‍රතිශතය ගණනය කරන්න.

---

04. සංගීත ප්‍රසංගයක රු. 2 000, රු. 1 500, රු. 1 000, රු. 500 බැගින් වූ ප්‍රවේශපත් අලෙවි කර ඇත. එක් එක් වර්ගයෙන් අලෙවි වී ඇති ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත වට ප්‍රස්තාරයේ දැක්වේ.



i) විකිණී ඇති රු. 1 000 ටිකට්පත් සංඛ්‍යාව 120 ක් නම් විකිණී ඇති මුළු ටිකට්පත් සංඛ්‍යාව සොයන්න.

ii) විකිණී ඇති රු. 2 000 ටිකට්පත් සංඛ්‍යාව 40 ක් නම් රු. 2 000 ටිකට්පත් නිරූපණය කරන කේන්ද්‍ර කෝණය සොයන්න.

iii) රු. 500 ටිකට් පත් විකිණීමෙන් ලැබූ ආදායම රු. 90 000 ක් නම්, වට ප්‍රස්තාරයේ රු. 500 ටිකට් නිරූපණය කරන කේන්ද්‍ර කෝණය සොයන්න.

iv) රු. 1500 ටිකට් විකිණීමෙන් ලද ආදායම සොයන්න.

05. (a) භාජනයක හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන G1, G2, G3, G4 හොඳ තත්ත්වයේ බල්බ 4 ක් හා B පිළිස්සුණු බල්බයක් ඇත. භාජනයෙන් අහඹු ලෙස බල්බ 2 ක් ගෙන හෝල්ඩර 2කට සම්බන්ධ කරන ලදී.

i) ගනු ලැබූ බල්බ සඳහා ලැබිය හැකි සියලු ප්‍රතිඵල ඇතුලත් නියැදි අවකාශය දී ඇති කොටු දැලෙහි නිරූපණය කරන්න.

ii) අඩු තරමින් එක් හෝල්ඩරයකට හෝ දැවුණු බල්බයක් සවි වී තිබීම යන සිද්ධිය කොටු දැලෙහි වටකර දක්වා එම සිද්ධිය සිදුවීමෙ සම්භාවිතාව සොයන්න.



(b) මෙම විදුලි බල්බ පහෙන් 2 ක් වොට් 20 (20W) ද, ඉතිරි ඒවා වොට් 12 (12W) ද නම් ගනු ලැබූ බල්බ 2 හි වොට් ගණන සලකා අඳින ලද අසම්පූර්ණ රුක් සටහන පහත දැක්වේ.



i) දී ඇති රුක් සටහනේ, ශාඛා මත අදාළ සම්භාවිතා ලකුණු කරන්න.

ii) දෙවනුව ගත් බල්බයේ වොට් ගණන නිරූපණය කිරීම සඳහා ඔබ ඇඳි රුක් සටහන දීර්ඝ කරන්න.

iii) රුක් සටහන භාවිතයෙන්, ගනු ලැබූ එක් බල්බයක් පමණක් 20 W වීමෙ සම්භාවිතාව සොයන්න.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය 2022 (2023) 1194

11 ශ්‍රේණිය | ගණිතය - II | පැය තුනයි

අමතර කියවීම් කාලය මිනිත්තු 10

වැදගත් :

★ A කොටසින් ප්‍රශ්න පහක් සහ B කොටසින් ප්‍රශ්න පහක් තෝරාගෙන ප්‍රශ්න දහයකට පිළිතුරු සපයන්න.
★ ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී අදාළ පියවර හා නිවැරදි ඒකක ලියා දක්වන්න.
★ සෑම ප්‍රශ්නයකට ම ලකුණු 10 බැගින් හිමිවේ.
★ අරය r වන ගෝලයක පරිමාව $\frac{4}{3}\pi r^3$ වේ.

A කොටස

★ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. රු. 108 000 ක් වන ශීතකරණයක් එහි වටිනාකමින් $\frac{1}{3}$ ක් පළමුව ගෙවා, ඉතිරිය එකක් රු. 4 950 බැගින් වූ සමාන මාසික වාරික 18 කින් ගෙවීමට ලබාගත හැක.

හීනවන ශේෂය මත පොලිය ගණනය කරයි නම්, ණය සඳහා අයකරන වාර්ෂික පොලී අනුපාතිකය සොයන්න.

02. $y = x^2 + 2x - 3$ වර්ගජ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීම සඳහා x හා y හි අසම්පූර්ණ අගය වගුවක් පහත දැක්වේ.

x	-4	-3	-2	-1	0	1	2
y	5	0	-3	......	-3	0	5

(a) i) $x = -1$ විට y හි අගය සොයන්න.

ii) සම්මත අක්ෂ පද්ධතිය හා සුදුසු පරිමාණයක් යොදාගනිමින් ඉහත වගුවට අනුව ප්‍රස්තාර කඩදාසියක ප්‍රස්තාරය අඳින්න.

(b) ඔබේ ප්‍රස්තාරය ඇසුරින්,

i) ශ්‍රිතය සෘණව අඩුවන x හි අගය ප්‍රාන්තරය ලියන්න.

ii) $x(x+2) = 3$ හි මූල සොයන්න.

iii) ඔබ ඇඳි ප්‍රස්තාරය සිරස්ව ඒකක 1 ක් පහළට විස්ථාපනය කළ විට එහි සමීකරණය $y = (x + a)^2 + b$ ආකාරයට ලියා දක්වන්න.

03. (a) කුමන අභයභූමිය නැරඹීමට පැමිණි 40 දෙනෙකුගෙන් යුත් සංචාරක කණ්ඩායමක් සඳහා ජීප් රථ 4 ක් හා කැබ් රථ 2 ක් ගෙන්වා ගත්විට දෙදෙනෙකුට ආසන මදි වූ හෙයින් ජීප් රථයක් ආපසු යවා තවත් කැබ් රථ 2 ක් ගෙන්වා ගනු ලැබීය. එවිට එහි ආසනයක් අතිරික්ත විය. ජීප් රථයක ඇති ආසන ගණන x ද, කැබ් රථයක ඇති ආසන ගණන y ද ලෙස ගෙන සමගාමී සමීකරණ දෙකක් ගොඩනගා විසඳීමෙන්, හරියටම 52 දෙනෙකුට අසුන්ගෙන යාම සඳහා ගෙන්වා ගත යුතු ජීප් රථ සංඛ්‍යාව හා කැබ් රථ සංඛ්‍යාව සොයන්න.

(b) $x + \frac{1}{x} = a$ නම්, $x^2 + \frac{1}{x^2}$ හි අගය a ඇසුරින් ප්‍රකාශ කරන්න.

---

04. පරිමිතිය 22 m ක් වූ සෘජුකෝණාස්‍රාකාර කලාලයක දිග මීටර් x වෙයි.

i) එහි පළල x ඇසුරෙන් ලියන්න.

ii) එහි වර්ගඵලය $19\,m^2$ ක් නම්, $x^2 - 11x + 19 = 0$ තෘප්ත කරන බව පෙන්වන්න.

iii) $\sqrt{5} = 2.24$ ගෙන ඉහත වර්ගජ සමීකරණය විසඳීමෙන් කලාලයේ දිග, පළල මෙන් සිව් ගුණය ඉක්මවන බව පෙන්වන්න.

---

05. උතුරු, දකුණු දිශාව ඔස්සේ වැටී ඇති සෘජු මාර්ගයක A නම් ස්ථානයක සිට නිරීක්ෂණය කළ විට 040^0 ක දිගංශයකින් P සෙල්ලිපියක් දිස්වන අතර A සිට 50 m ක් උතුරු දිශාවට ගමන් කර B වෙත පැමිණ නිරීක්ෂණය කළ විට ඉහත P සෙල්ලිපිය දිස්වනුයේ 130^0 ක දිගංශයකිනි.

i) A, B හා P හි පිහිටීම් වල දළ සටහනක් ඇඳ එහි මිනුම් සටහන් කරන්න.

ii) $A\hat{P}B$ හි විශාලත්වය සොයන්න.

iii) ත්‍රිකෝණමිතික වගු භාවිතයෙන් AP දුර සොයන්න.

iv) P හි සිට BP දිශාවට 20 m ක් දුරින් Q නම් තවත් සෙල්ලිපියක් පිහිටා ඇත්නම් $A\hat{Q}P$ හි විශාලත්වය සොයන්න.

---

06. දන්ත සායනයක දී දන්ත වෛද්‍යවරයෙකුට රෝගියෙකු පරීක්ෂා කිරීමට ගතවන කාලය පිළිබඳ ලබාගත් තොරතුරු පහත වගුවේ දැක්වේ.

කාලය (මිනිත්තු)	1 - 5	6 - 10	11 - 15	16 - 20	21 - 25	26 - 30	31 - 35
රෝගීන් ගණන	2	6	9	15	10	7	1

i) මාත පන්තිය කුමක්ද ?

ii) මාත පන්තියේ මධ්‍ය අගය උපකල්පිත මධ්‍යන්‍යය ලෙස ගෙන රෝගියෙකු පරීක්ෂා කිරීමට වෛද්‍යවරයාට ගතවන මධ්‍යන්‍ය කාලය සොයන්න.

iii) දන්ත සායනයේ සමාන කාර්යක්ෂමතාවයකින් යුත් දන්ත වෛද්‍යවරුන් 6 දෙනෙක් දිනපතාම පෙ.ව. 8.00 සිට ප.ව. 2.00 තෙක් රෝගීන් පරීක්ෂා කරයි නම්, (දිනපතා දන්ත සායනය පැවැත්වේ යැයි උපකල්පනය කරන්න.) මාසයක් තුළ දී සායනයේ පරීක්ෂා කළ හැකි රෝගීන් ගණන 3500 ඉක්මවන බව පෙන්වන්න.

B කොටස

★ ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

07. මැරතන් ධාවන තරගයක ප්‍රථම ස්ථානය සඳහා රු. 15 000 ක් ද, දෙවන ස්ථානය සඳහා රු. 14 500 ක් ද, තෙවන ස්ථානය සඳහා රු. 14 000 ක් ද වන පරිදි ප්‍රථම ස්ථානයේ සිට 20 වන ස්ථානය තෙක් මුදල් ත්‍යාග පිරිනැමූ අතර, විසිවන ස්ථානයෙන් පසුව තරගය නිමකරන සෑම ක්‍රීඩකයෙකුටම රු. 2 000 ක මුදලක් ද පිරිනමන ලදී.

i) 12 වන ස්ථානය ලබාගත් ක්‍රීඩකයාට ලැබෙන ත්‍යාග මුදල සොයන්න.

ii) රු. 5 500 ක මුදල් ත්‍යාගය හිමිවන්නේ කී වන ස්ථානයට තරගය නිම කළ ක්‍රීඩකයාට ද ?

iii) පළමු ස්ථාන 20 සඳහා මුදල් ත්‍යාග පිරිනැමීමට වැයවන මුදල සොයන්න.

iv) මැරතන් ධාවන තරගයේ මුදල් ත්‍යාග පිරිනැමීමට සංවිධායක මණ්ඩලයට වැය වූ මුදල රුපියල් 241 000 ක් නම් තරගය නිමකළ ක්‍රීඩකයින් ගණන සොයන්න.

---

08. පහත දැක්වෙන නිර්මාණ සඳහා cm/ mm පරිමාණයන් සහිතව සරල දාරයක් හා කවකටුවක් පමණක් භාවිතා කරන්න. නිර්මාණ රේඛා පැහැදිලිව දක්වන්න.

i) $AB = BC = 6cm$ ද, $A\hat{B}C = 120^0$ වන පරිදි ABC සමද්විපාද ත්‍රිකෝණය නිර්මාණය කරන්න.

ii) B හා C හරහා යන්නා වූ ද AC මත කේන්ද්‍රය පිහිටන වෘත්තය නිර්මාණය කර එය AC ඡේදනය කරන ලක්ෂ්‍යය D ලෙස නම් කරන්න.

iii) BA ට CE සමාන්තර වන සේ ද, $D\hat{E}C = 90^0$ වන පරිදි E ලක්ෂ්‍යය සොයන්න.

---

09. (a) පැත්තක දිග 7 cm වන ඝනකාකාර හැඩයේ භාජනයකට විෂ්කම්භය a cm වන අර්ධ ගෝලාකාර භාජනයකින් ජලය පුරවා 12 වාරයක් දැමූ විට සම්පූර්ණයෙන්ම පිරුණි. $a = \frac{7}{\sqrt[3]{\pi}}$ බව පෙන්වන්න.

(b) $\frac{\sqrt{43.2} \times 0.85}{2.084}$ හි අගය ලඝුගණක වගු භාවිතයෙන් ආසන්න පළමු දශමස්ථානයට සොයන්න.

---

10. ABC ත්‍රිකෝණයේ AB හා AC පාදවල මධ්‍ය ලක්ෂ්‍ය පිළිවෙලින් D හා E වෙයි. CD හා BE, F හි දී ඡේදනය වෙයි.



i) DC ට සමාන්තරව A හරහා ඇඳි සරල රේඛාවට දික්කළ BE, G හි දී හමුවේ. දී ඇති රූපය පිටපත් කරගෙන ඉහත තොරතුරු එහි ඇතුළත් කරන්න.

ii) $CEF\Delta \equiv AEG\Delta$ බව

iii) $2DF = CF$ බව

iv) $EF = \frac{1}{4}BG$ බව පෙන්වන්න.

11. A, B, C හා D යනු රූපයේ දැක්වෙන O කේන්ද්‍රය වන වෘත්තය මත පිහිටි ලක්ෂ්‍ය හතරකි. AC විෂ්කම්භයක් වන අතර A හි දී වෘත්තයට ඇඳි ස්පර්ශකයට දික් කළ CB හා දික් කළ CD පිළිවෙලින් P හා Q හි දී හමුවේ.



i) BPQD වෘත්ත චතුරස්‍රයක් බව පෙන්වන්න.

ii) $AB^2 = BC \cdot BP$ බව පෙන්වන්න.
(සමකෝණී ත්‍රිකෝණ ඇසුරෙන් හෝ අන් අයුරකින්)

---

12. පාසලක ක්‍රීඩා උළෙල සඳහා ඉදිරිපත් වූ තරගකරුවන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

ε = {ඉදිරිපත් වූ තරගකරුවන්}
A = {ජවන තරග සඳහා සහභාගි වූ අය}
B = {පිටිය තරග සඳහා සහභාගි වූ අය}
C = {කණ්ඩායම් තරග සඳහා සහභාගි වූ අය}



$n(\varepsilon) = 100, n(A) = 50, n(B) = 40, n(C) = 60$
$n(A \cap B \cap C) = 15, n(A \cap B) = 23$

i) දී ඇති වෙන් රූපය පිටපත් කරගෙන දක්වා ඇති තොරතුරු එහි ඇතුළත් කරන්න.

ii) ජවන හා පිටිය තරග සඳහා පමණක් ඉදිරිපත් වූ තරගකරුවන් සංඛ්‍යාව සොයන්න.

iii) $n(A \cup B \cup C)' = 7$ ද, පිටියේ තරග සඳහා ඉදිරිපත් වූ සංඛ්‍යාවෙන් $\frac{1}{4}$ ක් වෙනත් කිසිදු තරගයකට ඉදිරිපත් නොවූයේ නම් ද වෙන්රූපය සම්පූර්ණ කරන්න.

iv) පිටිය හෝ කණ්ඩායම් තරග සඳහා ඉදිරිපත් වූ තරගකරුවන් සංඛ්‍යාව කොපමණද ?

v) $(A \cup B)' \cap C$ මගින් දැක්වෙන්නේ කවුරුන්ද ?

PAST PAPERS WIKI
WWW.PastPapers.WIKI
Download past papers, notes, and more from Past Papers Wiki!